**NLDB ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය**

**මැදරට පශු සම්පත් සංවර්ධන මධ්‍යස්ථානය,**
**මහබේරියතැන්න,**
**දිගන,**
**රජවැල්ල.**

**Mid Country Livestock Development Centre**
**Mahaberiyathenna,**
**Digana,**
**Rajawella.**

**Fax- 081-2374277**

**Tel - 081-5631740 / 077 - 3782139**

මගේ යොමු අංකය :-NLDB/27/II/O - 02

දිනය :2026.05.18

.........................................
.........................................
.........................................
……………………………
මහත්මයාණෙනි,

**කිරිගව පාලනය පිළිබඳ මාසික පුහුණු පාඨමාලාව.**

උක්ත පාඨමාලාව 2026.06.01 වෙනි දින ආරම්භ කිරීමට බලාපොරොත්තු වන අතර 2026.05.31 වන දින සවස (රාත්‍රී ආහාර රුගෙන පැමිණිය යුතුයි) හෝ 2026.06.01 වෙනි දින පෙ:ව: 09:00ට පෙර දිගන මහබේරියතැන්න පිහිටි මැදරට පශු සම්පත් සංවර්ධන මධ්‍යස්ථානය වෙත වාර්තා කළ යුතුය. මධ්‍යස්ථානයේ ඇති නේවාසිකාගාරයේ නවාතැන් පහසුකම් සලසා ඇති අතර ආහාරපාන ඔබ විසින් සපයා ගත යුතුය.

01. පුහුණු ගාස්තුව රු: 100,000.00 කි.(මෙයට අමතරව වැට් මුදල් එකතු විය හැක) මෙම මුදල පුහුණු පාඨමාලාව ආරම්භයට පෙර මහජන බැංකුවේ අංක 119-100-12000-2152 ගිණුමට (කළමණාකරු, මැදරට පශු සම්පත් සංවර්ධන මධ්‍යස්ථානය) අත්තිකාරම් මුදලක් හෝ සම්පූර්ණ මුදල තැන්පත් කිරීමෙන් අනතුරුව එහි පිටපතක් අප කාර්යාලය වෙත භාරදිය යුතුයි.
02. ගොවිපල දුෂ්කර කාර්යයන් ඉටුකිරීමට සුදුසු මානසික හා ශාරීරික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු අතරලමෙය ඇගයීමට ද ලක් කෙරේග
03. ජාතික හැදුනුම්පත රැගෙන ආ යුතුයි.
04. අවශ්‍ය සටහන් තබා ගැනීමට පිටු 200 තනිරූල් පොතක් හා පෑන් , පැන්සල් ආදිය රැගෙන ආ යුතුයි.
05. මධ්‍යස්ථානය විසින් ආහාර පිසීම සිදු කරදෙන අතර අවශ්‍ය ආහාර ද්‍රව්‍ය පැමිණෙන කණ්ඩායම විසින් සපයා දිය යුතුයි.
06. උපදෙස් මාලාව මෙහි පසු පිටෙහි සඳහන් කර ඇත.
07. මණ්ඩලයේ අවශ්‍යතාව පරිදි පාඨමාලාව පැවැත්වෙන දිනය වෙනස් විය හැකි අතර ඒ පිළිබඳව ලිඛිතව හෝ දුරකතන ඇමතුමක් මගින් ඔබ වෙත දැනුම් දීමට කටයුතු කරමි.

ස්තූතියි,
මෙයට - විශ්වාසී වූ,

............................................................
කළමනාකරු.
මැදරට පශු සම්පත් සංවර්ධන මධ්‍යස්ථානය

සැ.යු. :- මෙම පාඨමාලාව සඳහා සීමිත පිරිසක් බඳවා ගන්නා බැවින් ඔබගේ පැමිණීම,සහභාගිවීමට බලාපොරොත්තු වන මාසය සහ අත්තිකාරම් මුදල් ගෙවූ බවට තහවුරු කිරීම අනිවාර්ය බව සලකන්න.(077-3782139/කළමණාකරු)

## ප්‍රායෝගික ගව පාලනය පිළිබඳ පාඨමාලාවේ පුහුණුවන්නන් සඳහා උපදෙස් මාලාව

- **පහත සඳහන් කරුණු ඔබ විසින් සැළකිල්ලට ගත යුතුය.**

- අදාල පුහුණු කාළය තුළ දී නිවාඩු ලබා ගත නොහැක.
- මාසික පුහුණු පාඨමාලාව දින 28 කින් සමන්විත වන බැවින් අදාල දින 28 මැදරට පශු සම්පත් සංවර්ධන මධ්‍යස්ථානයේ මෙන්ම බෝපත්තලාව/මැණික්පාලම/ඩයගම/රිදියගම යන ගොවිපල වලින් එක් ගොවිපලක රැඳී සිටිමින් න්‍යායික හා ප්‍රායෝගික පුහුණුව ලබාගත යුතු බව.
- කිසිදු අවස්ථාවකදි පුහුණු පාඨමාලාවේ පුහුණු කාළය දින 28 කට අඩු වූ විට සහතිකය ලබා නොදෙන බව.
- දින 28 කට අඩුවෙන් පාඨමාලාව නිම කිරීමේදී අඩු වූ දින ගණන සඳහා ප්‍රායෝගික පුහුණුව එම ගොවිපල් වල රැඳී සිට නිම කළ යුතු බව.
- උඩරට කලාපයේ ගොවිපල් ප්‍රදේශවලට නිරතුරුවම වර්ෂාව පවතින බැවින් අදාල කාලය තුළ දී එයට සරිලන පරිදි වැහිකබා,තොප්පි,කුඩ සහ ගම්බූට්ස් යනාදිය රැගෙන පැමිණීම වඩා යෝග්‍ය වේ.
- නේවාසිකව සිටින බැවින් අදාල ඇඳ ඇතිරිලි සහ පෙරවීමට රෙදි ආදිය රැගෙන ආ යුතු බව. උඩරට කලාපයේ ගොවිපල් ප්‍රදේශවලට නිරතුරුවම වර්ෂාව පවතින බැවින් සීතලට සරිලන පරිදි පෙරවීමට රෙදි රැගෙන එන්නේ නම් වඩාත් යෝග්‍ය වනු ඇත.
- ප්‍රායෝගික පුහුණුව නිරන්තරයෙන් ගව ගාල්වල සිදු කරන බැවින් අත් වැසුම් භාවිත කිරීම වඩා සුදුසු බව.

දිගන නගරය

